


Morahela, Balangoda

www.imbulpe.ps.gov.lk

045-2287361

imbulpeps@gmail.com


2025 අයවැය ලේඛනය | 2025 வரவுசெலவுத் திட்டம் | 2025 BUDGET REPORT

# 2025 අයවැය ලේඛනය
# வரவுசெலவுத் திட்டம்
# BUDGET REPORT



ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව

இம்புல்பே பிரதேச சபை

IMBULPE PRADHESHIYA SABH

# 2025 - අයවැය ලේඛනය

# 2025 - வரவுசெலவுத் திட்டம்

# 2025 - BUDGET REPORT

## ඉඹුල්පේ ප්‍රාදේශිය සභාව

## இம்புல்பே பிரதேச சபை

## IMBULPE PRADHESHIYA SABH




# දැක්ම

"ඉසුරින් පිරි සුපසන් පුරවරයක්"

# මෙහෙවර

"පැවරී ඇති බලතල කාර්ය කර්තව්‍යයන් ඵලදායී ලෙස යොදා ගනිමින් ජනතාවගේ ජීවන තත්ත්වය සුඛිත මුදිත කිරීම අපගේ මෙහෙවර වන්නේය"

# පටුන


| අනු අංකය | විස්තරය | පිටු අංකය |
|---|---|---|
| 01 | ලේකම් තුමියගේ පණිවිඩය | 01 |
| 02 | ඉඹුල්පේ ප්‍රාදේශිය සභා බල ප්‍රාදේශයේ පිහිටීම, පසුබිම හා පරිපාලනය | 02 |
| 03 | පොදු සංඛ්‍යාත්මක තොරතුරු | 04 |
| 04 | අනුමත සේවක සංඛ්‍යාව | 05 |
| 05 | සංවිධාන සටහන | 06 |
| 06 | 2025 වැඩසටහන් අය වැය සම්මත කිරීම | 07 |
| 07 | පුනරාවර්තන අය සාරාංශය | 08 |
| 08 | පුනරාවර්තන වැය සාරාංශය | 09 |
| 09 | පුනරාවර්තන ප්‍රාග්ධන ලැබීම් හා පුනරාවර්තන ප්‍රාග්ධන වැය සාරාංශය | 10 |
| 10 | අය සාරාංශය හා ඇස්තමේන්තුව වැඩසටහන් අංක 01 පොදු පරිපාලනය | 11 |
| 11 | අය සාරාංශය හා ඇස්තමේන්තුව වැඩසටහන් අංක 02 සෞඛ්‍ය සේවා | 13 |
| 12 | අය සාරාංශය හා ඇස්තමේන්තුව වැඩසටහන් අංක 03 භෞතික සැලසුම් මං මාවත් හා ගොඩනැගිලි | 15 |
| 13 | අය සාරාංශය හා ඇස්තමේන්තුව වැඩසටහන් අංක 04 ජල සේවා | 17 |
| 14 | අය සාරාංශය හා ඇස්තමේන්තුව වැඩසටහන් අංක 05 මහජන උපයෝගිතා | 19 |
| 15 | අය සාරාංශය හා ඇස්තමේන්තුව වැඩසටහන් අංක 06 සුබ සාධන සේවා | 21 |
| 16 | වැය සාරාංශය හා ඇස්තමේන්තුව වැඩසටහන් අංක 01 පොදු පරිපාලනය | 23 |
| 17 | වැය සාරාංශය හා ඇස්තමේන්තුව වැඩසටහන් අංක 02 සෞඛ්‍ය සේවා | 26 |
| 18 | වැය සාරාංශය හා ඇස්තමේන්තුව වැඩසටහන් අංක 03 භෞතික සැලසුම් මං මාවත් හා ගොඩනැගිලි | 29 |
| 19 | වැය සාරාංශය හා ඇස්තමේන්තුව වැඩසටහන් අංක 04 ජල සේවා | 32 |
| 20 | වැය සාරාංශය හා ඇස්තමේන්තුව වැඩසටහන් අංක 05 මහජන උපයෝගිතා | 35 |
| 21 | වැය සාරාංශය හා ඇස්තමේන්තුව වැඩසටහන් අංක 06 සුබ සාධන සේවා | 37 |



# ලේකම්තුමියගේ පණිවිඩය

**"ඉසුරින් පිරි සුපසන් පුරවරයක්" යන දැක්ම යථාර්තයක් කරගැනීමේ අරමුණින් ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය, අධ්‍යාපන, සුබ සාධන හා මහජන උපයෝගීතා සේවා වඩාත් ගුණාත්මකව හා කාර්යක්ෂමව ඉටු කිරීම පෙරදැරිව වර්ෂ 2025 අය වැය ඉදිරිපත් කර ඇති බව සතුටින් දන්වා සිටිමි.**

**ඉඹුල්පේ ප්‍රාදේශිය සභාව විසින් මෙතෙක් සිදු කළ සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යමින්, නීතියෙන් නියම කළ සීමාවන්ට යටත්ව ස්වකීය ආදායම් ඉලක්ක වෙත ලඟා වීමටත්, මුල්‍යමය වශයෙන් තිරසාර පළාත් පාලන ආයතනයක් බවට පත් කිරීමට මෙන්ම ප්‍රාදේශීය සභා කොට්ඨාස 13 ආවරණය වන පරිදි ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට අවශ්‍ය වැඩසටහන් සංවිධානය කිරීමට හා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරමි.**

**2025 අය වැය සැකසීමේ දී යෝජනා ඉදිරිපත් කළ සියලු දෙනාටත්, සාර්ථක හා නිවැරදි අය වැය ලේඛනයක් සකස් කිරිමට කටයුතු කළ විෂය නිලධාරීතුමාටත්, අවශ්‍ය තොරතුරු ලබා දෙමින් සහයෝගය දැක් වූ සමස්ත කාර්යය මණ්ඩලයටත්, ත්‍රෛභාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවමින් දෙමළ හා ඉංග්‍රීසි භාෂා ද්වයන්ගෙන් පරිවර්තනය සිදු කළ දෙපලටත් මාගේ ස්තූතිය පුද කරමි.**

**උදාවන්නා වූ 2025 වසර ඔබ සැමට සතුට, සෞභාග්‍ය සපිරි යහපත් බලාපොරොත්තු ඉටු වන සුබ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමි.**

**ජේ.ජී.එස්. වික්‍රමසිංහ**
**ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි**
**ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව**

# ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පිහිටීම, පසුබිම හා පරිපාලනය

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ උතුරු සීමාවට අයත් පළාත් පාලන ආයතනයකි. උතුරින් නුවරඑළිය දිස්ත්‍රික්කයේ අඹගමුව ප්‍රාදේශීය සභාවට ද, නැගෙනහිරින් බදුල්ල දිස්ත්‍රික්කයේ හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාවට ද, දකුණින් බලන්ගොඩ ප්‍රාදේශීය සභාවට හා බලන්ගොඩ නගර සභාවට ද, බස්නාහිරින් රත්නපුර ප්‍රාදේශීය සභාවට හා බලන්ගොඩ ප්‍රාදේශීය සභාවට මායිම් ව පිහිටා ඇත. ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට අයත් හෙක්ටයාර 25600 ක සීමාව තුළ ප්‍රාදේශීය සභා කොට්ඨාස 13 ක් ,ග්‍රාම නිලධාරී වසම් 50 ක් හා ගම් 256 ක් පිහිටා ඇත.




ප්‍රාදේශීය සභා සීමාව තුළ වියළි, තෙත් හා අන්තර්කලාපීය දේශගුණ තත්ත්වයන් දැකිය හැකිය. සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 25 ක් පමණ වන අතර උතුරු කලාපයට වන්නට උෂ්ණත්වය සෙල්සියස් අංශක 20 දක්වා අඩු වේ. මෙම කලාපයට ඊසානදිග හා නිරතදිග මෝසම මඟින් වර්ෂාව ලැබෙන අතර, වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර් 2000 ත් 4500 ත් අතර වේ.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාබල ප්‍රදේශය ඓතිහාසික හා පුරා විද්‍යාත්මක තොරතුරු අනුව ක්‍රි.පූ. දෙවන සියවස දක්වා විහිදුණ ඓතිහාසික පසුබිමක් ඇති අතර, රාවණා යුගය දක්වා තොරතුරු ජනශ්‍රැති ඇසුරින් හඳුනා ගත හැකිය. ඉඹුල්පේ ප්‍රාදේශීය

සභාව කඩවත කෝරලයෙහි උඩුවග්ගම් පත්තුව හා තලාපිට ගම් පත්තුව ඒකාබද්ධ කර 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත යටතේ සංස්ථාපනය කර ඇත. අතීතයේ දී කඩවත කෝරලයෙහි උඩුවග්ගම් පත්තුවේ ගම් සභා කාර්යාලය මොරහැල ප්‍රදේශයේ පිහිටා තිබුණු අතර, එහි ප්‍රථම මැම්බර් මහතා ලෙස රත්මලවින්නේ මුදලිහාමි මහතා කටයුතු කර ඇති අතර පසුව පී පැලිස් කුරේ මහතා මැම්බර් මහතා ලෙස තේරී පත්වී ඇත. තලාපිටගම්පත්තු ගම් සභා කාර්යාලය බෙලිහුල්ඔය ප්‍රදේශයේ පිහිටා තිබුණු අතර එහි ප්‍රථම මැම්බර් මහතා ලෙස පුවක්ගහවෙල එන්. ඒ. චාර්ලිස් අප්පුහාමි මහතා ද පසුව මුත්තෙට්ටුවේගම එස්.එම්. බංඩෙ මහතා හා ජී.ඩී.බී. පුංචි මහත්තයා මහතා ද තේරී පත්වී ඇත. වර්ෂ 1980 දී ගම් සභා ක්‍රමය අහෝසි කර ඒ වෙනුවට සංවර්ධන සභා ආරම්භ කර ඇත. රත්නපුර දිස්ත්‍රික් සංවර්ධන සභාවේ උප කාර්යාලයක් මොරහැල ප්‍රදේශයේ පිහිටා තිබූ අතර, ප්‍රථම සභාපතිවරයා ලෙස රත්මලවින්නේ ආරිය සුමිත්‍ර සෙල්ලහේවා මහතා තේරී පත් වී ඇත.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත යටතේ ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීමෙන් පසු වර්ෂ 1988 සිට වර්ෂ 2024 දක්වා විවිධ අවස්ථාවල ප්‍රාදේශීය සභා මැතිවරණ මගින් තේරී පත් වූ සභාපතිවරයෙක්, උප සභාපතිවරයෙක් හා මන්ත්‍රී මණ්ඩලයක් මගින් හෝ ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි මගින් පාලනය කටයුතු සිදු කර ඇත.

- ගරු සභාපති ඒච්.ඒච්. මෙත්තානන්ද මැතිතුමා 1988 සිට 1989 දක්වා
- ගරු සභාපති ජේ.එච්.එල්. විජේරත්න මැතිතුමා 1990.03.08 සිට 1991.06.30 දක්වා
- ගරු සභාපති ජේ.එම්.එල්. විජේරත්න මැතිතුමා 1991.07.01 සිට 1996.12.30 දක්වා
- ගරු සභාපති ඩබ්.බී.එම්. වීරසේකර බණ්ඩාර මැතිතුමා 1997.04.25 සිට 2002 දක්වා
- ගරු සභාපති ඊ.ඒ. වජිර දිසානායක මැතිතුමා 2002.04.15 සිට 2006 දක්වා
- ගරු සභාපති ඩී.ආර්. ඉන්දු ගුණතිලක මැතිතුමා 2006.04.15 සිට 2011.01.06 දක්වා
- ගරු සභාපති ඩී.ආර්.ඉන්දු ගුණතිලක මැතිතුමා 2011.01.06 සිට 2015.0514 දක්වා
- ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි
  ඩී. එස්. වතුකාරවත්ත මිය 2015.05.14 සිට 2017.08.22 දක්වා
- ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි
  ඩී. ජී. ජේ. කේ. ජයවර්ධන මයා 2017.08.23 සිට 2017.11.28 දක්වා
- ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි
  ඩී. එස්. වතුකාරවත්ත මිය 2017.11.29 සිට 2018.03.19 දක්වා
- ගරු සභාපති එස්.ජී.වී.ඒ ශ්‍රී ලාල් සෙනරත් 2018.03.20 සිට 2023.03.19 දක්වා
- ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි
  ඩී.ඒ.සී. රෝහිණී දසනායක මිය 2023.03.20 සිට 2024.02.15 දක්වා
- ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි
  ජේ.ජී.එස්.වික්‍රමසිංහ මිය 2024.02.16 සිට මේ දක්වා

මේ වන විට සභාපති සහ උප සභාපති ධූරය දැරීම අවසන් වීම හේතු කොටගෙන, සභාපතිවරයා හෝ උප සභාපතිවරයා වෙත පවරා ඇති එකී බලතල 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත 9 (3) වගන්තිය යටතේ ලේකම් වෙත පැවරී ඇත. ලේකම්ගේ තීරණ ගැනීමේ පහසුව සඳහා ප්‍රතිපත්ති හා තීරණ ගැනීමට සහාය වීමේ කමිටුවක් පත් කර ඇත.

# පොදු සංඛ්‍යාත්මක තොරතුරු

| |
|---|
| පළාත - සබරගමුව |
| දිස්ත්‍රික්කය - රත්නපුර |
| ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය - ඉඹුල්පේ |
| මැතිවරණ කොට්ඨාශය - බලන්ගොඩ |
| ග්‍රාම නිලධාරී වසම් - 50 යි |
| ප්‍රාදේශිය සභා මන්ත්‍රී කොට්ඨාස - 13යි |
| ගම් - 256 යි |
| බල ප්‍රදේශයේ විශාලත්වය - වර්ග කිලෝ මීටර් 256 |
| වාර්ෂික වර්ෂාපතනය - මිලි මීටර් 2000 - 4000 |
| උෂ්ණත්වය - සෙල්සියස් අංශක 25 |



# අනුමත සේවක සංඛ්‍යාව

| අනු අංකය | තනතුරු නාමය | අනුමත සංඛ්‍යාව | | සිටින සංඛ්‍යාව | | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| | | ස්ථිර | කොන්ත්‍රාත් | ස්ථිර | කොන්ත්‍රාත් | | |
| 1. | ලේකම් කළමනාකරණ සහකාර අධි ශ්‍රේණිය | 01 | 00 | 01 | 00 | 00 | 00 |
| 2. | ආයුර්වේද වෛද්‍ය නිලධාරි | 01 | 00 | 00 | 00 | 01 | 00 |
| 3. | සංවර්ධන නිලධාරී | 19 | 00 | 23 | 00 | 00 | 04 |
| 4. | තාක්ෂණ සේවා නිලධාරී | 02 | 00 | 01 | 00 | 01 | 00 |
| 5. | තාක්ෂණ සහකාර | 01 | 00 | 00 | 00 | 01 | 00 |
| 6. | පුස්තකාලයාධිපති | 02 | 00 | 01 | 00 | 01 | 00 |
| 7. | කළමණාකරන සේවා නිලධාරී | 08 | 00 | 06 | 00 | 02 | 00 |
| 8. | ආදායම් පරීක්ෂක නිලධාරී | 02 | 00 | 01 | 00 | 01 | 00 |
| 9. | බර යන්ත්‍ර ක්‍රියාකරු | 01 | 00 | 01 | 00 | 00 | 00 |
| 10. | රියදුරු | 05 | 00 | 06 | 01 | 00 | 01 |
| 11. | විදුලි කාර්මික | 02 | 00 | 02 | 00 | 00 | 00 |
| 12. | ඖෂධ සංයෝජක | 01 | 00 | 01 | 00 | 00 | 00 |
| 13. | කාර්යාල කාර්ය සහයක | 03 | 00 | 03 | 00 | 00 | 00 |
| 14. | මුරකරු | 02 | 00 | 02 | 00 | 00 | 00 |
| 15. | පුස්තකාල සහයක | 03 | 00 | 03 | 00 | 00 | 00 |
| 16. | වැඩක්ෂේත්‍ර කම්කරු | 11 | 03 | 11 | 03 | 00 | 00 |
| 17. | සෞඛ්‍ය කම්කරු | 07 | 02 | 08 | 02 | 00 | 02 |
| එකතුව | | **71** | **05** | **70** | **06** | **07** | **07** |

# සංවිධාන සටහන


සභාව
ගොඩනැගිලි සැලසුම් කමිටුව
පරිසර හා සෞඛ්‍ය කමිටුව
නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව
මුදල් හා ප්‍රතිපත්ති සැලසුම් කමිටුව
ටෙන්ඩර් හා කර්මාන්ත කමිටුව
තාක්ෂණ ඇගයීම් කමිටුව
සභාපති
ලේකම්
ආයුර්වේද වෛද්‍ය නිලධාරී
ප්‍රධාන කළමණාකරණ සේවා නිලධාරී
පුස්තකාලයාධිපති
තාක්ෂණ සේවා නිලධාරී
කළමණාකරණ සේවා නිලධාරී
සංවර්ධන නිලධාරී
ඖෂධ සංයෝජක
ආදායම් පරිපාලක
කාර්යාල කාර්ය සහයක
රියදුරු
බර යන්ත්‍ර ක්‍රියාකරු
පුස්තකාල සහයක
ආයුර්වේද කම්කරු
මුරකරු
වැඩ ක්ෂේත්‍ර කම්කරු
සෞඛ්‍ය කම්කරු
ජල සහයක

# 2025 වැඩසටහන් අයවැය සම්මත කිරීම

**1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 168 (1) වන වගන්තිය හා 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීතිවල 11 හා 12 රීතියේ අදාල නියමයන්ට අනුකූලව පිළියෙල කරන ලද 2025 වර්ෂය සඳහා වන අය වැය ලේඛනය 2024.11.01 දින ප්‍රතිපත්ති හා තීරණ ගැනීමට සහය වීමේ කමිටුවේ තීරණ අංක 19 යටතේ නිර්දේශය ද සලකා අනුමත කිරිමට ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය හා කර්තව්‍ය ඉටු කරනු ලබන ලේකම් වන මම තීරණය කරමි.**

**ජේ.ජී.එස්. වික්‍රමසිංහ**<br>
**ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි**<br>
**ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව**

**2024 නොවැම්බර් මස 01 වන දින**<br>
**ඉඹුල්පේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.**

# 2025 වර්ෂයේ පුනරාවර්තන අය සාරාංශය

| ගිණුම් සංකේතය | අය විෂය විස්තර | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් මංමාවත් හා ගොඩනැගිලි | ජල සේවා | මහජන උපයෝගීතා සේවා | සුභසාධාන සේවා | එකතුව | ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|---|---|---|
| 10 | වරිපනම් බදු | 817,708.32 | 445,000.00 | 00.00 | 00.00 | 1,000.00 | 50,000.00 | 1,313,708.32 | **1.21** |
| 20 | කුලී | 00.00 | 00.00 | 2,100,000.00 | 120,000.00 | 2,628,200.00 | 00.00 | 4,848,200.00 | **4.48** |
| 30 | බලපත්‍ර ගාස්තු | 251,000.00 | 950,000.00 | 00.00 | 00.00 | 00.00 | 00.00 | 1,201,000.00 | **1.11** |
| 40 | සේවා | 75,000.00 | 1,301,000.00 | 501,500.00 | 8,260,000.00 | 25,000.00 | 5,000.00 | 10,167,500.00 | **9.39** |
| 50 | වරෙන්තු ගාස්තු | 3,006,000.00 | 00.00 | 1,000.00 | 90,000.00 | 20,000.00 | 25,000.00 | 3,142,000.00 | **2.90** |
| 60 | වෙනත් ආදායම් | 27,114,000.00 | 156,000.00 | 500,000.00 | 2,000.00 | 00.00 | 45,000.00 | 27,817,000.00 | **25.68** |
| 70 | ආදායම් අධාර | 29,468,384.80 | 9,224,028.80 | 13,664,884.00 | 2,892,950.40 | 1,272,340.80 | 3,318,465.60 | 59,841,054.40 | **55.24** |
| එකතුව | | 60,732,093.12 | 12,076,028.80 | 16,767,384.00 | 11,364,950.40 | 3,946,540.80 | 3,443,465.60 | 108,330,462.72 | **100.00** |
| ප්‍රතිශතය | | **56.06** | **11.15** | **15.48** | **10.49** | **3.64** | **3.18** | **100.00** | |

# 2025 වර්ෂයේ පුනරාවර්තන වැය සාරාංශය

| ගිණුම් සංකේතය | අය විෂය | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් මංමාවත් හා ගොඩනැගිලි | ජල සේවා | මහජන උපයෝගීතා සේවා | සුභසාධාන සේවා | එකතුව | ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | වැටුප් දීමනා | 29,099,063.20 | 9,249,451.20 | 13,974,154.40 | 3,075,208.00 | 1,322,489.60 | 3,771,302.40 | 60,491,668.80 | **61.15** |
| 02 | ගමන් වියදම් | 801,000.00 | 450,000.00 | 200,000.00 | 10,000.00 | 10,000.00 | 30,000.00 | 1,501,000.00 | **1.52** |
| 03 | සැපයුම් හා උපකරණ | 5,150,000.00 | 3,570,000.00 | 3,020,000.00 | 135,000.00 | 00.00 | 760,000.00 | 12,635,000.00 | **12.77** |
| 04 | ප්‍රග්ධන වත්කම් අලුත්වැඩියාව හා නඩත්තුව | 2,475,000.00 | 1,430,000.00 | 4,260,000.00 | 2,000,000.00 | 600,000.00 | 230,000.00 | 10,995,000.00 | **11.11** |
| 05 | ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 2,581,000.00 | 970,000.00 | 300,000.00 | 3,800,000.00 | 700,000.00 | 130,000.00 | 8,481,000.00 | **8.57** |
| 06 | පොළී හා ලාභාංෂ | 00.00 | 00.00 | 133,000.00 | 1,000.00 | 00.00 | 00.00 | 134,000.00 | **0.14** |
| 07 | ආධාර මුදල් දායක මුදල් හා සහනාධාර | 571,000.00 | 140,000.00 | 66,000.00 | 00.00 | 408,000.00 | 796,000.00 | 1,981,000.00 | **2.00** |
| 08 | විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික | 1,129,971.60 | 508,299.60 | 751,915.80 | 127,742.40 | 50,851.20 | 138,163.20 | 2,706,943.80 | **2.74** |
| එකතුව | | 41,807,034.80 | 16,317,750.80 | 22,705,070.20 | 9,148,950.40 | 3,091,340.80 | 5,855,465.60 | 98,795,612.60 | **100.00** |
| ප්‍රතිශතය | | **42.26** | **16.49** | **22.95** | **9.25** | **3.12** | **5.92** | **100.00** | |

# 2025 වර්ෂයේ පුනරාවර්තන ප්‍රාග්ධන ලැබීම් හා පුනරාවර්තන ප්‍රාග්ධන වැය සාරාංශය

| අය විෂය | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් මංමාවත් හා ගොඩනැගිලි | ජල සේවා | මහජන උපයෝගීතා සේවා | සුභසාධන සේවා | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| පුනරාවර්තන ආදායම | 60,732,093.12 | 12,076,028.80 | 16,767,384.00 | 11,364,950.40 | 3,946,540.80 | 3,443,465.60 | 108,330,462.72 |
| ප්‍රාග්ධන ආදායම | 0 | 3,000,000.00 | 12,500,000.00 | 10,000,000.00 | 3,500,000.00 | 1,500,000.00 | 30,500,000.00 |
| **එකතුව** | **60,732,093.12** | **15,076,028.80** | **29,267,384.00** | **21,364,950.40** | **7,446,540.80** | **4,943,465.60** | **138,830,462.72** |
| පුනරාවර්තන වියදම | 41,807,034.80 | 16,317,750.80 | 22,705,070.20 | 9,148,950.40 | 3,091,340.80 | 5,855,465.60 | 98,925,612.60 |
| ප්‍රාග්ධන වියදම | 500,000.00 | 3,050,000.00 | 19,102,000.00 | 11,251,000.00 | 3,500,000.00 | 2,500,000.00 | 39,903,000.00 |
| **එකතුව** | **42,307,034.80** | **19,367,750.80** | **41,807,070.20** | **20,399,950.40** | **6,591,340.80** | **8,355,465.60** | **138,828,612.60** |
| **අතිරික්තය / හිඟය** | **18,425,058.32** | **(4,291,722.00)** | **(12,539,686.20)** | **965,000.00** | **855,200.00** | **(3,412,000.00)** | **1,850.12** |

# අය සාරාංශය හා ඇස්තමේන්තුව - 2025

## වැඩසටහන් අංක 01 - පොදු පරිපාලනය

පොදු පරිපාලනය පළමු වර්ගීකරණය වන අතර ආයතනයේ සාමාන්‍ය පරිපාලන කටයුතු, කාර්ය මණ්ඩල කටයුතු, ආයතනයේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය සම්බන්ධ කටයුතු හා පුහුණු කටයුතු මේ යටතට ගනු ලැබේ. වරිපනම් හා අක්කර බදු පොදු පරිපාලනය යටතේ ඇති ප්‍රධාන ආදායම් ප්‍රභවයන් වේ.

- **වරිපනම් බදු (අය ශිර්ෂය 1/11)**

වරිපනම් බදු යනු සියලුම පළාත් පාලන ආයතන විසින් පනවා ඇති නීති රීති වලට අනුව ප්‍රදේශය තුළ තම ආයතනයට පැවරී ඇති කාර්යන් සඳහා වූ වියදම් පියවා ගැනීමට යොදාගනු ලබන ප්‍රධානම ආදායම් ප්‍රභවයයි. වරිපනම් කළාප තුළ කසල බැහැර කිරීම , මාර්ග සහ කානු පද්ධති වැඩිදියුණුව , නඩත්තුව, වීථි පහන් නඩත්තුව, පානිය ජල පහසුකම් සැපයීම ඇතුලු ප්‍රජා සංවර්ධනය හා බැදි කාරණා ප්‍රවර්ධනය සිදුකරනු ලබයි. ප්‍රාදේශිය සභාවට අයත් ගලගම හා පින්නවල වරිපනම් කලාප 2ක තුළ වරිපනම් ඒකක 507 ක් පිහිටා ඇති අතර, සෑම වර්ෂයක් ආරම්භයේ දී දේපළ සම්බන්ධයෙන් තක්සේරු නිවේදනයක් ලබාදෙනු ලැබේ. වර්ෂ 05 ට වරක් තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් වරිපනම් කලාප තුළ සෑම දේපලකම වාර්ෂිකව වටිනාකම තක්සේරු කරන අතර ගෘහස්ථ හා ව්‍යාපාරික ස්ථාන සඳහා එම තක්සේරුවෙන් 4% ක් වරිපනම් බදු වශයෙන් අයකරනු ලැබේ. 2025 වර්ෂය සඳහා වරිපනම් ගාස්තු ලෙස රු.538,208.32 ක මුදලක් උපයා ගැනීමට අපේක්ෂා කරනු ලැබේ.

- **අක්කර බදු (අය ශිර්ෂය 1/12)**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වගන්තිය ප්‍රකාරව අක්කර බදු අය කරනු ලැබේ. ප්‍රාදේශීය සභාව සතු අක්කර බදු ඒකක ගණන 70 ක් වන අතර සෑම වර්ෂයකම ආරම්භයේදී දේපල සම්බන්ධව තක්සේරු නිවේදන නිකුත් කරනු ලබයි. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවතින ගොඩ ඉඩම් පිළිබඳ සමීක්ෂණයක් සිදු කර හෙක්ටයාර 01 සිට 05 දක්වා ඉඩම් වලින් රුපියල් 50 ක මුදලක් ද ඊට වැඩි වන සෑම හෙක්ටයාරයකටම රුපියල් 10 ක මුදලක් ද වාර්ෂිකව අය කරනු ලැබේ. 2025 වර්ෂය සඳහා අක්කර බදු ලෙස රු.21,000.00 ක මුදලක් උපයා ගැනීමට අපේක්ෂා කරනු ලැබේ.

- **දැන්වීම් පුවරු ගාස්තු (අය ශිර්ෂය 1/37)**

ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් පුවරු වෙනුවෙන් එම පුවරු වල ප්‍රමාණය අනුව ගාස්තු අය කරනු ලැබේ. පසුගිය වර්ෂ වලට සාපේක්ෂව බැලීමේදී මෙම ගාස්තු අය කිරීම වාර්ෂිකව වැඩිවී ඇති බව පැහැදිලි වේ. ඒ අනුව 2025 වර්ෂය සඳහා දැන්වීම් පුවරු ගාස්තු රු.250,000.00 ක් උපයා ගැනීමට අපේක්ෂා කරනු ලැබේ.

- **ඉඩම් කට්ටි කිරීම මත බදු (අය ශිර්ෂය 1/18)**

බල ප්‍රදේශයේ ඉඩම් කට්ටි කර විකිණීමේ දී අයකරන බදු ලෙස රු.250,000.00 ක් 2025 වර්ෂය සඳහා ඇස්තමේන්තු කර ඇත.

මීට අමතරව උසාවි දඩ, මුද්දර ගාස්තු ලැබීම් සහ ආදායම් ආධාර වැනි මූල්‍ය උත්පාදන මාර්ග තුළින් රු. 57,383,384.80 මුදලක් අපේක්ෂා කෙරේ.



| ශීර්ෂය | ආදායම් වර්ගය | 2022 සත්‍ය ආදායම | 2023 සත්‍ය ආදායම | 2024.06.30 සත්‍ය ආදායම | 2025 ඇස්තමේන්තුව |
|---|---|---|---|---|---|
| **10 වරිපනම් බදු** | | | | | |
| 1.11 | වරිපනම් | 244,351.68 | 259,183.81 | 345,401.88 | 538,208.32 |
| 1.11(1) | වරිපනම් ලේඛනයේ නම වෙනස්කිරීම සඳහා ගාස්තු | 00.00 | 00.00 | 00.00 | 7,500.00 |
| 1.11(2) | වරිපනම් ලේඛනයේ උදෘතයක් ලබාදීම සඳහා | 00.00 | 00.00 | 00.00 | 1,000.00 |
| 1.12 | අක්කර බදු | 22,570.00 | 67,438.89 | 16,293.12 | 21,000.00 |
| 1.18 | ඉඩම් කට්ටි කිරීම මත බදු | 00.00 | 100,360.00 | 00.00 | 250,000.00 |
| එකතුව | | **266,921.68** | **426,982.70** | **361,695.00** | **817,708.32** |
| **30 බලපත්‍ර ගාස්තු** | | | | | |
| 1.35 | වාහන හා සත්ත්ව බදු(අලි ඇතුන් බයිසිකල්) | 00.00 | 00.00 | 00.00 | 1,000.00 |
| 1.37 | වෙනත්(දැන්වීම් පුවරු ගාස්තු) | 50,409.75 | 331,481.25 | 79,572.75 | 250,000.00 |
| **එකතුව** | | **50,409.75** | **331,481.25** | **79,572.75** | **251,000.00** |
| **40 සේවා ගාස්තු** | | | | | |
| 1.41 | ලි.ප. කිරීමේ සහතික හා පරීක්ෂණ ගාස්තු (සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම) | 72,000.00 | 72,000.00 | 5,500.00 | 75,000.00 |
| **එකතුව** | | **72,000.00** | **72,000.00** | **5,500.00** | **75,000.00** |
| **50 වරෙන්තු ගාස්තු** | | | | | |
| 1.51 | වරෙන්තු ගාස්තු | 00.00 | 00.00 | 00.00 | 1,000.00 |
| 1.52 | දඩ (උසාවියෙන් ලැබෙන මුදල්) | 2,205,375.00 | 2,802,503.00 | 00.00 | 3,005,000.00 |
| **එකතුව** | | **2,205,375.00** | **2,802,503.00** | **00.00** | **3,006,000.00** |
| **60 වෙනත් ආදායම්** | | | | | |
| 1.61(1) | පොලී(ආයෝජන පොලී) | 240,020.92 | 645,842.88 | 328,049.30 | 1,190,000.00 |
| 1.61(2) | පොලී( දේපල ණය පොලී) | 64,836.41 | 68,213.88 | 53,690.79 | 132,000.00 |
| 1.62(1) | විකුණුම්(මුද්‍රිත පෝරම, අබලි ද්‍රව්‍ය) | 160,592.41 | 251,922.00 | 138,170.69 | 150,000.00 |
| 1.62(2) | වෙනත් ලැබීම් ( ප්‍රදාන) | 3,029,167.20 | 2,338,723.88 | 206,037.08 | 250,000.00 |
| 1.64 | ක්‍රියාත්මක ආදායම්(සේවක ණය පොලී) | 273,923.90 | 337,870.41 | 171,263.85 | 350,000.00 |
| 1.65 | මුද්දර ගාස්තු ලැබීම් | 14,522,353.00 | 21,013,274.00 | 17,275,282.00 | 25,042,000.00 |
| **එකතුව** | | **18,290,893.84** | **18,290,893.84** | **18,172,493.71** | **27,114,000.00** |
| **70 ආදායම් ආධාර** | | | | | |
| 1.71(1) | සේවක වැටුප් ප්‍රතිපූර්ණ | 17,400,680.48 | 19,192,345.47 | 9,170,595.16 | 24,688,384.80 |
| 1.71(2) | මන්ත්‍රී දීමනා ප්‍රතිපූර්ණ | 4,695,000.00 | 1,397,700.00 | 00.00 | 4,680,000.00 |
| 1.71(3) | උපාධි පුහුණු ප්‍රතිපූර්ණ | 00.00 | 00.00 | 00.00 | 100,000.00 |
| **එකතුව** | | **22,095,680.48** | **20,590,045.45** | **9,170,595.16** | **29,468,384.80** |
| **මුළු එකතුව** | | **42,981,280.75** | **48,878,859.47** | **27,789,856.62** | **60,732,093.12** |

# අය සාරාංශය හා ඇස්තමේන්තුව - 2025

## වැඩසටහන් අංක 02 - සෞඛ්‍ය සේවා

සෞඛ්‍ය සේවා දෙවන වර්ගීකරණය වන අතර සභා බල ප්‍රදේශය තුළ සෞඛ්‍ය ආරක්ෂිත පරිසරයක් ඇතිකිරීම හා පවත්වා ගෙන යාම සඳහා විධිමත් ලෙස කසළ කළමණාකරණය කිරීම, හෝටල් හා වෙළඳ සැල් නියාමනය කිරීම වැනි කාර්යයන් තුළින් ලැබෙන ආදායම හා කාබනික පොහොර අලෙවියෙන් ලැබෙන ආදායම මේ යටතේ වර්ග කර ඇත.

**• කසළ ගාස්තු (අය ශීර්ෂය 2/42)**

ප්‍රදේශයේ වරිපනම් කලාප වලට අයත් නොවන නිවාස සහ ව්‍යාපාරික ආයතන තුළින් බැහැර කරන කසල රැස්කිරීම වෙනුවෙන් අයකරන ගාස්තු මෙයට ඇතුළත් වේ.2025 වර්ෂයේ දී අපේක්ෂිත ආදායම රු. 1,200,000.00 කි. දැනට කසළ ලබාදෙන ස්ථාන 170 ක් පමණ වේ. මේ වන විට බදුල්ල හා පින්නවල ප්‍රධාන මාර්ග දෙකට අමතරව අතුරු මාර්ග දක්වාද අපගේ සේවාව ව්‍යාප්ත කර ඇත.

**• වෙළඳ බලපත්‍ර ගාස්තු (අය ශීර්ෂය 2/31)**

සම්මත අතුරු ව්‍යවස්ථාව හා වෙනත් අතුරු ව්‍යවස්ථා අනුව බලපත්‍ර නිකුත් කිරීම තුළින් උත්පාදනය වන ආදායම් මීට ඇතුලත්වේ. අපේක්ෂිත ආදායම රු.650,000.00 කි.

**• ව්‍යපාර බදු (අය ශීර්ෂය 2/13)**

බල ප්‍රදේශයේ වරිපනම් පවත්වාගෙන යන බලපත්‍ර ලබාගැනීමට අවශ්‍ය නොවන ව්‍යාපාර වලින් අය කරනු ලබන බදු මුදල් මෙයට ඇතුළත් වේ. 2025 වර්ෂයේ අපේක්ෂිත ආදායම රු.445,000.00 කි.

**• විශේෂ ගාස්තු (අය ශීර්ෂය 2/36)**

සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝටල් වලින් අය වෙතැයි පුරෝකථනය කර ඇති රු 300,000.00 මුදල අය ශීර්ෂයට ඇතුලත් වේ. මෙයට අමතරව වෙනත් ආදායම්, ආදායම් ආධාර හා ප්‍රාග්ධන ලැබීම් තුලින් රු 12,380,028.80 ක මුදලක් ඇස්තමේන්තු කර ඇත.



| ශීර්ෂය | ආදායම් වර්ගය | 2022 සත්‍ය ආදායම | 2023 සත්‍ය ආදායම | 2024.06.30 සත්‍ය ආදායම | 2025 ඇස්තමේන්තුව |
|---|---|---|---|---|---|
| **10 වරිපනම් බදු** | | | | | |
| 2.13 | ව්‍යාපාර බදු | 596,780.00 | 697,470.00 | 473,400.00 | 445,000.00 |
| **එකතුව** | | **596,780.00** | **697,470.00** | **473,400.00** | **445,000.00** |
| **30 බලපත්‍ර ගාස්තු** | | | | | |
| 2.31 | වෙළෙඳ බලපත්‍ර | 258,970.00 | 326,500.00 | 221,580.00 | 650,000.00 |
| 2.36 | විශේෂ ගාස්තු (සංචාරක හෝටල් ගාස්තු) | 278,646.06 | 439,795.14 | 444,949.10 | 300,000.00 |
| **එකතුව** | | **537,616.06** | **766,295.14** | **666,529.10** | **950,000.00** |
| **40 සේවා සඳහා ගාස්තු** | | | | | |
| 2.41 | ලි.ප. සහතික හා පරීක්ෂණ ගාස්තු (පාරිසරික බලපත්‍ර පරීක්ෂණ ගාස්තු) | - | - | - | 100,000.00 |
| 2.42 | කසළ ගාස්තු | 827,000.00 | 718,800.00 | 768,000.00 | 1,200,000.00 |
| 2.43 | අයකර ගත හැකි ගාස්තු (සුසාන භූමි ගාස්තු හා සුනඛයන් ලියාපදිංචි කිරීම) | 12,000.00 | 5,000.00 | - | 1,000.00 |
| **එකතුව** | | **839,000.00** | **723,800.00** | **768,000.00** | **1,301,000.00** |
| **60 වෙනත් ආදායම්** | | | | | |
| 2.62 | විකුණුම් (වෛද්‍ය සහතික) | 200.00 | 7,900.00 | 7,500.00 | 1,000.00 |
| 2.64 | ඝණ අපද්‍රව්‍ය කළමණාකරණය (නොදිරන කසළ) | - | 12,035.00 | 53,771.00 | 80,000.00 |
| 2.65 | කාබනික පොහොර අලෙවිය. | 660,605.00 | 56,640.00 | 49,280.00 | 75,000.00 |
| **එකතුව** | | **660,805.00** | **76,575.00** | **110,551.00** | **156,000.00** |
| **70 ආදායම් ආධාර** | | | | | |
| 2.71 | සේවක වැටුප් ප්‍රතිපූර්ණ | 4,793,522.43 | 4,411,012.08 | 2,435,000.00 | 9,224,028.80 |
| 2.72 | සේවා සඳහා ගාස්තු (ආයුර්වේද ආධාර) | - | - | - | - |
| **එකතුව** | | **4,793,522.43** | **4,411,012.08** | **2,435,000.00** | **9,224,028.80** |
| **80 ප්‍රාග්ධන ලැබීම්** | | | | | |
| 2.80(1) | ඝණ අපද්‍රව්‍ය කළමණාකරණය (වැඩිදියුණු කිරීම්) | - | - | - | 2,000,000.00 |
| 2.80(2) | ආදාහනාගාරයක් ඉදි කිරීම | | | | 1,000,000.00 |
| **එකතුව** | | **-** | **-** | **-** | **3,000,000.00** |
| **මුළු එකතුව** | | **7,427,723.49** | **6,675,152.22** | **4,453,480.10** | **15,076,028.80** |

# අය සාරාංශය හා ඇස්තමේන්තුව - 2025

## වැඩසටහන් අංක 03 - භෞතික සැළසුම් මං මාවත් ඉඩම් හා ගොඩනැගිලි

තුන්වන වර්ගීකරණය භෞතික සැළසුම් මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි වේ. මේ යටතේ ප්‍රධාන ආදායම් ප්‍රභවයන් තුනක් හඳුනාගෙන ඇත.

- **යන්ත්‍ර කුලියට දීම - අය ශීර්ෂය 3.24 (1)/3.24(2)**

මෙම අය ශීර්ෂය යටතේ ප්‍රධාන වශයෙන්ම සභාව සතු බැකෝ ලෝඩර් යන්ත්‍රය කුළියට දීම මඟින් ලැබෙන ආදායම ඇතුළත් කර ඇති අතර, ඊට අමතරව ලෙලන තලනය කුලියට දීම හා සම්පීඩන යන්ත්‍රය කුලියට දීම මඟින් ලැබෙන ආදායම ද ඇතුළත්ව ඇත. අපේක්ෂිත ආදායම රු. 2,100,000.00 කි.

- **සේවා සඳහා ගාස්තු - අය ශීර්ෂය 3/43 -3 /44**

මේ යටතේ ප්‍රධාන වශයෙන් නොපවරා ගැනීමේ සහතික සහ ගොඩනැගිලි සීමා සහතික නිකුත් කිරීම, හියුම් බට අලෙවිය, ගොඩනැගිලි සැලසුම් හා අනුකූලතා සහතික ලබා දීම හා බිම් කට්ටි සැළසුම් අනුමත කිරීම මඟින් ඇස්තමේන්තු ගත ආදායම රු.501,500.00කි.

මෙයට අමතරව වරෙන්තු ගාස්තු සහ දඩ, ආදායම් ආධාර හා දායක මුදල් හා කර්මාන්ත ලැබීම් හා සූර්ය බල ශක්ති පද්ධතියේ ආදායම හා වෙනත් ආදායම් මගින් රු. 26,665,884.00 ක් 2025 වර්ෂය සඳහා ඇස්තමේන්තු කර ඇත.මේ යටතේ පින්නවල කුඩා නගරය ඉදිකිරීම සඳහා ඉඩම් අත්පත්කර ගැනීම කෙරෙහි අවධානය යොමුකර ඇත.



| ශීර්ෂය | ආදායම් වර්ගය | 2022 සත්‍ය ආදායම | 2023 සත්‍ය ආදායම | 2024.06.30 සත්‍ය ආදායම | 2025 ඇස්තමේන්තුව |
|---|---|---|---|---|---|
| | **20 කුලී** | | | | |
| 3.24(1) | යන්ත්‍රය කුළියට දීම (ජේ.සී.බී) | 881,625.00 | 2,788,780.00 | 957,850.00 | 2,000,000.00 |
| 3.24(2) | යන්ත්‍රය කුළියට දීම (වෙනත් යන්ත්‍ර) | | | | 100,000.00 |
| | **එකතුව** | **881,625.00** | **2,788,780.00** | **957,850.00** | **2,100,000.00** |
| | **40 වෙනත් සේවා** | | | | |
| 3.43(1) | නොපවරා ගැනීමේ හා ගොඩනැගිලි සීමා සහතික නිකුත් කිරීම | 120,000.00 | 136,250.00 | 105,200.00 | 198,000.00 |
| 3.43(2) | කොන්ත්‍රාත් කරුවන් ලියාපදිංචි කිරීම | 1,250.00 | - | - | 2,500.00 |
| 3.44(1) | ගොඩනැගිලි සැළසුම් හා අනුකූලතා සහතික ගාස්තු/විදුලි සංදේශ කුළුණු ඉදිකිරීම් | 374,363.00 | 225,270.00 | 241,000.00 | 250,000.00 |
| 3.44(2) | ඉඩම් කට්ටි සැලසුම් අනුමත කිරීම | 29,750.00 | 26,500.00 | 23,000.00 | 50,000.00 |
| 3.44(3) | හියුම්බට අලෙවිය | 37,600.00 | - | 1,000.00 | 1,000.00 |
| | **එකතුව** | **562,963.00** | **388,020.00** | **370,200.00** | **501,500.00** |
| | **50 වරෙන්තු ගාස්තු හා දඩ** | | | | |
| 3.51 | වරෙන්තු ගාස්තු (කර්මාන්ත ප්‍රමාද දඩ) | 00.00 | 00.00 | 00.00 | 1,000.00 |
| | **එකතුව** | **00.00** | **00.00** | **00.00** | **1,000.00** |
| | **60 වෙනත් ආදායම්** | | | | |
| 3.62 | පෝර්ම ගාස්තු හා වෙනත් ලැබීම් (අනතුරුදායක ගස් හා ගොඩනැගිලි සැලසුම් අයදුම්පත්‍ර) | 46,545.00 | 31,720.00 | 35,220.00 | 100,000.00 |
| 3.63 | සූර්ය බල ශක්ති ලැබීම්(ගලගම බහුකාර්ය ගොඩනැගිල්ල) | 00.00 | 507,548.54 | 149,804.78 | 400,000.00 |
| | **එකතුව** | **46,545.00** | **539,268.54** | **185,024.78** | **500,000.00** |
| | **70 ආදායම් ආදාර** | | | | |
| 3.71 | සේවක වැටුප් ප්‍රතිපූර්ණ | 9,255,680.00 | 10,287,190.18 | 4,858,088.36 | 13,664,884.00 |
| | **එකතුව** | **9,255,680.00** | **10,287,190.18** | **4,858,088.36** | **13,664,884.00** |
| | **80 ප්‍රාග්ධන ලැබීම්** | | | | |
| 3.81 | කර්මාන්ත ලැබීම් | 43,443.54 | 24,775.06 | 397,039.50 | 10,000,000.00 |
| 3.82 | පින්නවල කුඩානගරය ඉදිකිරීම සඳහා ඉඩම අත්පත් කරගැනීමට ප්‍රතිපාදන ලබාගැනීම. | - | - | - | 2,500,000.00 |
| | **එකතුව** | **43,443.54** | **24,775.06** | **397,039.50** | **12,500,000.00** |
| | **මුළු එකතුව** | **10,790,256.54** | **14,028,033.78** | **6,768,202.64** | **29,267,384.00** |

# අය සාරාංශය හා ඇස්තමේන්තුව - 2025

## වැඩ සටහන් අංක 04 - ජල සේවා

ජල සේවා සභාවේ සිව්වන වැඩසටහන වේ. ප්‍රදේශයේ ජනතාවගේ ජල අවශ්‍යතාවය ඉටු කිරීම සඳහා සභා බල ප්‍රදේශයම ආවරණය වන පරිදි ජල ව්‍යාපෘති 09 ක් ඇති අතර, අදාළ ජල ව්‍යාපෘති සම්පූර්ණයෙන්ම සභාව විසින් පාලනය කරනු ලැබේ. මෙම ජල ව්‍යාපෘති වල මනු කියවීම මඟින් ලැබෙන ආදායම සභාව වෙත ලැබෙන ප්‍රධානම ස්වයං උත්පාදන ආදායම වේ.

- **ජල ගාස්තු (අය ශීර්ෂ 4/14)**
  - අලුත්නුවර සිඩ්නි එල්ලාවල ජල ව්‍යාපෘතිය
  - නළුවෙල ජල ව්‍යාපෘතිය
  - වැටකොළුලන්ද ජල ව්‍යාපෘතිය
  - පින්නවල ජල ව්‍යාපෘතිය
  - රත්මලවින්න ජල ව්‍යාපෘතිය
  - පඹගින්න ජල ව්‍යාපෘතිය
  - අමුවතුගොඩ ජල ව්‍යාපෘතිය
  - ගලගම ජල ව්‍යාපෘතිය
  - නාකැටියවත්ත ජල ව්‍යාපෘතිය

ඉහත ජල යෝජනා ක්‍රම මඟින් සපයන ජලය සඳහා අය කරන ගාස්තු වෙනුවෙන් 2025 වර්ෂය සඳහා ඇස්තමේන්තුකර ඇති අදායම රු 8,000,000.00 කි.

- **ජල බවුසරය කුළියට දීම (අය ශීර්ෂ 4/25)**

සභාව සතු ජල බවුසරය කුළියට දීම මඟින් උපයා ගැනීමට අපේක්ෂිත ආදායම රු. 100,000.00 වේ.

- **සේවා සඳහා ගාස්තු (අය ශීර්ෂ 4/43)**

නව ජල සම්බන්ධතා ලබා දීම වෙනුවෙන් අය කරන ගාස්තු මීට ඇතුලත් වේ. නව ජල සැපයීමක් වෙනුවෙන් අයකරන ගාස්තුව රු.13,000.00 වේ. නව ජල සම්බන්ධතා ලබාදීම් වැඩි කිරීම මඟින් 2025 වර්ෂයේදී මේ මඟින් අපේක්ෂිත ආදායම රු.260,000.00 වේ.

මීට අමතරව ජල සේවා අයදුම්පත් ගාස්තු ,වරෙන්තු ගාස්තු හා දඩ ආදායම් ආධාර හා දායක මුදල් සහ 2025 වර්ෂයේදී ජල ව්‍යාපෘති නවීකරණය හා ජල පිරිපහදු ඒකකයක් ඉදි කිරීම සඳහා ණය ගැනීම් ඇතුළත්ව අපේක්ෂිත ආදායම රු. 12982950.40 කි.



| ශීර්ෂය | ආදායම් වර්ගය | 2022 සත්‍ය ආදායම | 2023 සත්‍ය ආදායම | 2024.06.30 සත්‍ය ආදායම | 2025 ඇස්තමේන්තුව |
|---|---|---|---|---|---|
| **20 කුළී** | | | | | |
| 4.25(1) | ජල බවුසරය කුළියට දීම | 78,885.00 | 140,000.00 | 42,000.00 | 100,000.00 |
| 4.25(2) | ජල බවුසරය රඳවා තබා ගැනීමේ ගාස්තු | - | - | 4,000.00 | 15,000.00 |
| 4.25(3) | ජල බවුසරය කි.මී.10 ඉක්මවන අවස්ථාවලදී අමතර කි.මී. ගණනට අය කිරීමේ ගාස්තු | - | - | - | 5,000.00 |
| **එකතුව** | | **78,885.00** | **140,000.00** | **46,000.00** | **120,000.00** |
| **40 සේවා ගාස්තු** | | | | | |
| 4.41 | පානීය ජලය ලබාදීමේ ගාස්තු | 6,536,899.50 | 9,520,820.00 | 4,873,936.50 | 8,000,000.00 |
| 4.43 | අයකරගතහැකි ගාස්තු (නව ජල සේවා සැපයුම් ගාස්තු) | 445,000.00 | 470,000.00 | 227,500.00 | 260,000.00 |
| **එකතුව** | | **6,981,899.50** | **9,990,820.00** | **5,101,436.50** | **8,260,000.00** |
| **50 වරෙන්තු ගාස්තු හා දඩ** | | | | | |
| 4.51 | වරෙන්තු (විසන්ධි කළ ජල සේවා නැවත ලබා දීමේ ගාස්තු) | 10,500.00 | 54,000.00 | 18,000.00 | 60,000.00 |
| 4.52 | අනවසර ලබා ගැනීමේ දඩ | - | - | - | 30,000.00 |
| **එකතුව** | | **10,500.00** | **54,000.00** | **18,000.00** | **90,000.00** |
| **60 වෙනත් ආදායම්** | | | | | |
| 4.62 | විකුණුම්(ජල සේවා අයදුම් පත් හා වෙනත්) | 1,600.00 | 1,125.00 | 2,125.00 | 2,000.00 |
| **එකතුව** | | **1,600.00** | **1,125.00** | **2,125.00** | **2,000.00** |
| **70 ආදායම් ආධාර හා දායක මුදල්** | | | | | |
| 4.71 | සේවක වැටුප් ප්‍රතිපූර්ණ | 1,656,262.39 | 1,550,202.27 | 906,352.71 | 2,892,950.40 |
| **එකතුව** | | **1,656,262.39** | **1,550,202.27** | **906,352.71** | **2,892,950.40** |
| **80 ප්‍රාග්ධන ලැබීම්** | | | | | |
| 4.81(1) | ජල ව්‍යාපෘති නවීකරණය සඳහා ණය ලබා ගැනීම (පින්නවල,ගලගම,අලුත් නුවර,) | - | - | - | 5,000,000.00 |
| 4.81(2) | ජල පිරිපහදු ඒකකයක් ස්ථාපනය කිරීම | - | - | - | 5,000,000.00 |
| **එකතුව** | | **-** | **-** | **-** | 10,000,000.00 |
| **මුළු එකතුව** | | **8,729,146.89** | **11,682,147.27** | **6,073,914.21** | **21,364,950.40** |

# අය සාරාංශය හා ඇස්තමේන්තුව - 2025

## වැඩසටහන් අංක 05 - මහජන උපයෝගිතා සේවා

මෙම වැඩසටහන යටතේ කඩකාමර කුලී, පොළ බදු, සේවා ගාස්තු හා වරෙන්තු ගාස්තු යන අය ශීර්ෂ කෙරෙහි ප්‍රධාන වශයෙන් අවධානය යොමු කර ඇත.

- **වෙළඳ ස්ථාන කුලියට දීම (අය ශීර්ෂ 5/22)**

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව සතු පින්නවල පොල භූමියේ පිහිටි කඩ කාමර 05 කුලියට දීම මගින් අය කරගත හැකි ආදායම මෙයට ඇතුළත් වේ. 2024 වර්ෂයේ සිට මාසික කුළිය පමණක් අයකර ගැනීමට ඇත.ඒ අනුව 2025 වර්ෂයට අදාලව අපේක්ෂිත ආදායම රු.75,000.00 වේ.

- **පොළ බදු (අය ශීර්ෂ 5/23)**

පින්නවල හා පඹහින්න ප්‍රදේශ තුළ මහජන පොළ දෙකක් පැවති අතර ඉන් පින්නවල පොළ මේ වන විට ක්‍රියාකාරී තත්ත්වයේ නොපවතී. එම භූමියේ පොළ නැවත පැවැත්වීමට අපේක්ෂා කරන අතර, පසුගිය වර්ෂ කිහිපය තුළම එය ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමට අපහසු විය. ඒ අනුව පඹහින්න ප්‍රදේශයේ පවත්වා ගෙන යන මහජන පොළ මඟින් රු.60,000.00 ක ආදායමක් 2025 වර්ෂය සඳහා අපේක්ෂා කෙරේ.

- **ගොඩනැගිලි බදු කුළී (අය ශීර්ෂ 5/24)**

ගොඩනැගිලි බදු කුළී යටතේ ගලගම සංචාරක මධ්‍යස්ථානය, ගලගම බහු කාර්ය ගොඩනැගිල්ල හා දියපහස ගිමන්හල බදු දීම මඟින් ආදායම් ඉපයීමට අපේක්ෂා කරන අතර, 2025 වර්ෂය සඳහා රු. 2,080,000.00ක් ඇස්තමේන්තු ගත ආදායම වේ.

- **වරෙන්තු ගාස්තු (අය ශීර්ෂ 5/51)**

නියමිත පරිදි කඩ කාමර කුලී නොගෙවන කඩ කාමර තුළින් අය කිරීමට සිදුවන දඩ මුදල් මෙයට ඇතුළත් අතර අපේක්ෂිත ආදායම රු1,000.00 කි.මීට අමතරව වරෙන්තු ගාස්තු සහ ආදායම් ආධාර මගින් රු.1,743,200.00 මුදලක් අයවේ යැයි අපේක්ෂා කෙරේ.



| ශීර්ෂය | ආදායම් වර්ගය | 2022 සත්‍ය ආදායම | 2023 සත්‍ය ආදායම | 2024.06.30 සත්‍ය ආදායම | 2025 ඇස්තමේන්තුව |
|---|---|---|---|---|---|
| **10 වරිපනම් හා බදු** | | | | | |
| 5.13 | සභාව සතු ඉඩම් හා ශාලා රුස්වීම් සඳහා කුලියට දීම | - | - | - | 1,000.00 |
| **එකතුව** | | **-** | **-** | **-** | **1,000.00** |
| **20 කුලී** | | | | | |
| 5.22(1) | වෙළෙඳ අයිතිය බදු දීම (පින්නවල කඩකාමර) | 45,000.00 | 45,000.00 | 21,750.00 | 75,000.00 |
| 5.22(2) | පින්නවල කඩ කාමර වාර්ෂික කුලී | 245,000.00 | 245,000.00 | - | - |
| 5.23 | වෙළෙඳ අයිතිය බදු දීම (පොළ බදු) | 54,170.00 | 59,260.00 | 27,450.00 | 60,000.00 |
| 5.24(1) | ගලගම සංචාරක මධ්‍යස්ථානය බදු දීම | 137,850.00 | 320,000.00 | 179,100.00 | 480,000.00 |
| 5.24(2) | දියපහස ගිමන්හල බදු දීම | 292,490.00 | 256,400.00 | 157,400.00 | 463,200.00 |
| 5.24(3) | ගලගම බහුකාර්ය ගොඩනැගිල්ල බදු දීම | 600,000.00 | - | - | 800,000.00 |
| 5.24(4) | පහන්තුඩාව නැරඹුම් ප්‍රවේශපත්‍ර නිකුත් කිරිම | 409,840.00 | 690,200.00 | 348,800.00 | 750,000.00 |
| **එකතුව** | | **1,784,350.00** | **925,660.00** | **734,500.00** | **2,628,200.00** |
| **40 සේවා ගාස්තු** | | | | | |
| 5.43 | අය කර ගත හැකි ගාස්තු | - | - | - | 25,000.00 |
| **එකතුව** | | **-** | **-** | **-** | **25,000.00** |
| **50 වරෙන්තු ගාස්තු හා දඩ** | | | | | |
| 5.51 | වරෙන්තු ගාස්තු(ප්‍රමාද දඩ) | 1125.00 | 1,950.00 | 16,265.00 | 20,000.00 |
| **එකතුව** | | **1,125.00** | **1,950.00** | **16,265.00** | **20,000.00** |
| **70 ආදායම් ආධාර** | | | | | |
| 5.71 | සේවක වැටුප් ප්‍රතිපූර්ණ | 504,943.00 | 1,040,575.80 | 482,650.00 | 1,272,340.80 |
| **එකතුව** | | **504,943.00** | **1,040,575.80** | **482,650.00** | **1,272,340.80** |
| **80 ප්‍රාග්ධන ලැබීම්** | | | | | |
| 5.81 | පොල භූමි සංවර්ධනය කිරීම(පඹහින්න,පින්නවල) | **-** | **-** | - | 2,500,000.00 |
| 5.82 | පහන්තුඩාව නැරඹුම් ස්ථානය වැඩිදියුණු කිරීම. | **-** | **-** | - | 1,000,000.00 |
| **එකතුව** | | **-** | **-** | **-** | **3,500,000.00** |
| **මුළු එකතුව** | | **2,290,418.00** | **1,968,185.80** | **1,233,415.00** | **7,446,540.80** |

# අය සාරාංශය හා ඇස්තමේන්තුව - 2025

## වැඩසටහන් අංක 06 - සුභ සාධක සේවා

සුභ සාධක සේවා සභාවේ හය වන වැඩසටහන වේ. විනෝද බදු, පුස්තකාල සාමාජික ගාස්තු, පුස්තකාල පොත් ප්‍රමාද ගාස්තු, නැති වූ පොත් සඳහා දඩ හා නැණසල ලැබීම් මේ යටතේ ප්‍රධාන ආදායම් ලැබීම් ලෙස හඳුනාගත හැකිය.

- **විනෝද බදු (අය ශීර්ෂය 6/15)**

විනෝද බදු ආඥාපනත යටතේ අය කිරිමට අපේක්ෂා කරන රු.50,000.00 මුදල මෙයින් නිරූපනය කෙරේ.

- **සේවා සඳහා ගාස්තු (අය ශීර්ෂය 6/43)**

ප්‍රාදේශිය සභාව සතු පුස්තකාල වල සාමාජික ගාස්තු මෙයට ඇතුළත්වේ. අපේක්ෂිත ආදායම රු 5,000.00 කි.

- **වරෙන්තු ගාස්තු (අය ශීර්ෂය 6/51)**

පුස්තකාලය මගින් නිකුත් කරන ලද පොත් නිසි දින වකවානුව තුළ නැවත භාර දීමට අපොහොසත් වූ විට අය කරන ප්‍රමාද ගාස්තු මීට ඇතුළත් වේ. අපේක්ෂිත ආදායම රු 15,000.00 කි.

- **දඩ (අය ශීර්ෂය 6/52)**

ප්‍රාදේශිය සභාව සතු පුස්තකාල මගින් නිකුත් කළ පොත් අස්ථාන ගත වූ විට අය කරන දඩ මුදල් මීට ඇතුලත්වේ. අපේක්ෂිත ආදායම රු 10,000.00 කි.

- **නැණසල ලැබීම් {අය ශීර්ෂය 6/62(2)}**

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව සතු නැණසළ ආයතනය මගින් ප්‍රදේශයේ දූ දරුවන්ගේ දෙමළ හා පරිගණක දැනුම නංවාලීම සඳහා දෙමළ හා පරිගණක පංති සහන සේවා ගාස්තු යටතේ පැවැත්වේ. එමෙන්ම ඡයා පිටපත් ගැසීම,අන්තර් ජාල සේවා පහසුකම් ලබාදීම ඇතුළු සේවාවන් මේ මගින් සැපයෙන අතර මෙම සේවා සැපයීම තුළින් 2025 වර්ෂය සඳහා රු.40,000.00 ක ආදායමක් ඇස්තමේන්තු කර ඇත.

මෙයට අමතරව ආදායම් ආධාර හා පුස්තකාලයේ ඉහළ මහළ පුළුල් කිරීමට අපේක්ෂිත ප්‍රධාන ලැබීම් රු 4,818,465.60 ක මුදලක් 2025 වර්ෂය සඳහා ඇස්තමේන්තු කර ඇත.



| ශීර්ෂය | ආදායම් වර්ගය | 2022 සත්‍ය ආදායම | 2023 සත්‍ය ආදායම | 2024.06.30 සත්‍ය ආදායම | 2025 ඇස්තමේන්තුව |
|---|---|---|---|---|---|
| **10 වරිපනම් හා බදු** | | | | | |
| 6.15 | විනෝද බදු | - | 2,000.00 | 27,500.00 | 50,000.00 |
| එකතුව | | - | **2,000.00** | **27,500.00** | **50,000.00** |
| **40 සේවා සඳහා ගාස්තු** | | | | | |
